ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
2 වන මට්ටම - II වන වර්ෂාර්ධය
අවසාන විභාගය
**DSC2714 - සමාජ විද්‍යාවේ පදනම**

කාලයඃ පැය තුනයි.

| දිනය: 2023 ජනවාරි 29 | වේලාව: පෙ.ව. 9.30 - ප.ව. 12.30 |
|---|---|

උපදෙස්:

- ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලිව ලිවිය යුතුය.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු නව පිටුවකින් ආරම්භ විය යුතුය.

1) I. සමාජ විද්‍යාත්මක පරිකල්පනය යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 5)

II. සමාජ විද්‍යාව සහ අනෙකුත් සමාජ විද්‍යාවන් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 15)

2) I. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත අතර වෙනස කුමක්ද?

(ලකුණු 5)

II. ඔබ කැමති ඕනෑම පර්යේෂණ ගැටලුවක් භාවිතා කරමින් පර්යේෂණ ක්‍රියාවලියේ පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 15)

3) I. ප්‍රාථමික හා ද්විතියික සමාජානුයෝජනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5)

II. උදාහරණ සහිතව සමාජානුයෝජනයේ ප්‍රධාන කාරක විස්තර කරන්න.

(ලකුණු 15)

4) I. සංස්කෘතිය යනු කුමක්ද යන්න නිර්වචනය කර එහි ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

II. ගෝලීය සංස්කෘතිය ශ්‍රී ලාංකීය සංස්කෘතියට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

5) I. සමාජ ව්‍යුහය යනු කුමක්දැයි විස්තර කරන්න.

(ලකුණු 05)

II. කෘෂිකාර්මික හා කාර්මික සමාජ තුළ විවිධ සමාජ ව්‍යුහයන් දිස්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

6) සමාජ විද්‍යාවේ භාවිත වන පහත සඳහන් ප්‍රධාන න්‍යායාත්මක පර්යාවලෝක වලින් **එකක් (01)** විස්තර කරන්න.

I. සංවිධානවාදී පර්යාවලෝකය

II. කෘත්‍යවාදී පර්යාවලෝකය

III. සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදී පර්යාවලෝකය

(ලකුණු 20)

7) පහත සඳහන් ඕනෑම **දෙකක් (02)** සඳහා කෙටි සටහන් ලියන්න.

I. දර්පනතල ආත්මය (looking glass self)

II. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (Sigmund Freud)

III. සංස්කෘතික සාපේක්ෂතාවාදය (Cultural relativism)

IV. යොමු කණ්ඩායම (Reference group)

V. අපරාධ සහ අපගමනය (Crime and deviance)

VI. ලිබරල් ස්ත්‍රීවාදය (Liberal Feminism)

**(2x 10 =ලකුණු 20 යි)**

8) I. ජාතිය සහ වාර්ගිකත්වය යනු කුමක්ද යන්න වෙන්කර හඳුන්වන්න.

(ලකුණු 5)

II. ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග අතර සංස්කෘතික බහුත්වවාදය ක්‍රියාත්මක වන ආකාරය, එක් එක් කණ්ඩායම්වල සමාජ සංස්කෘතික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

9) I. ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය වෙන්කර හඳුන්වන්න.

(ලකුණු 5)

II. මෑත කාලීන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතික සන්දර්භය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවය පවතින ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

***ප්‍රකාශන හිමිකම් ඇවිරිණි***